# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1992/23 - 2016 නොවැම්බර් මස 09 වැනි බදාදා - 2016.11.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ලේකම්වරුන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය

ජනාධිපතිවරයා විසින් නියම කරන ලදුව 1979 අගෝස්තු මස 6 වැනි දින අංක 48/2 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ සහ කලින් කල සංශෝධිත, ලේකම්වරුන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය, 2015.09.16 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත උපලේඛනයෙහි සඳහන් ලෙසින් සංශෝධනය කිරීමට අතිගරු ජනාධිපතිතුමා නියම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අතිගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි,

පී. බී. අබේකෝන්,
ජනාධිපති ලේකම්.

2016 නොවැම්බර් මස 08 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

උපලේඛනය

(1) ලේකම්වරුන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 11 වැනි ඡේදය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

"(11) මේ සංග්‍රහයෙහි මතු දැක්වෙන විධිවිධාන, ජනාධිපති ලේකම්, අමාත්‍ය මණ්ඩලයේ ලේකම්, අග්‍රාමාත්‍ය ලේකම්, ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානී සහ ජනාධිපති ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම්වරුන් සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය";

11 - 1089


1A - G 24514 — 417 (2016/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*